**බෞද්ධ ශිෂ්ටාචාරය** - 2021

**ii පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය**

**i කොටස**

1)

I. ප්‍රජාපාලනය/ දන්දීම/ යාග කිරීම/ ඉගැනීම / කාමයේ නොඇලීම

II. .

- විශ්ව පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස සත්ත්වයා හා ලෝකය නිර්මාණය වූ බව
- වර්ණභේදය ප්‍රතික්ෂේප කිරීම
- බාහිර බලවේග පිළිබඳ විශ්වාසය නොතබා ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමට ඉගැන්වීම
- සත්ත්වයාගේ පහළවීම ජීව විද්‍යාත්මක පදනමක් මත සකස් වූ බව
- වාසෙට්ඨ. අස්සලායන . මධුර . අම්බට්ඨ සූත්‍රගත කරුණු

III.

- හෝතෘ - දෙවියන්ට යාග කිරීම පිණිස ආරාධනා කරන පූජකයා
- උද්ගාතෘ - දෙවියන් සතුටු වන ලෙසින් වේද පාඨ ගායනා කරන අය
- අධ්වර්යු - යාගයේ ප්‍රධානියා
- යාඥකාරක - යාගය කරන පූජකයා

IV. සතුන් වෙළඳාම /මස් වෙළඳාම /අවි ආයුධ වෙළඳාම /මත්ද්‍රව්‍ය වෙළඳාම /වස විස වෙළඳාම.

V. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයට අනුව
නියතිවාදී බව , සංසාර සුද්ධිවාදී බව , අකිරියවාදී බව , අහේතු අප්පච්චවාදී බව , මෙම කරුණු පදනම් කරගෙන සමාජ සදාචාරයට අහිත වන ආකාරය .

2)

I. සද්ධර්මය තමා විසින්ම අවබෝධ කළ යුතු බැවින් සම්මා සම්බුද්ධ නම් වේ .

II. බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව කෙලෙස් ගහන සමාජයේ ඉපිද දියෙහි නොතැවරී එන පියුමක් සේ කෙලෙස් සහිත ලෝකයා හා නොතැවරී පවිත්‍රව දිවිගෙවීම බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවන දර්ශනය යි.

III.

- සකුළුදායි පරිබ්‍රාජකයා - භවත්නි නිහඬ වන්න ශබ්ද කරන්න එපා. මෙහි ශ්‍රමණ භවත් ගෞතමයෝ එති.ඒ ආයුෂ්මත්හු නිහඬ බව ප්‍රිය කරති.
- පොට්ඨපාද පරිබ්‍රාජකයා - යම් කෙනෙක් නිපුන ද ඒ භාග්‍යවතුන් වහන්සේය.
- චංකි බමුණා - තමන් භවත් ගෞතමයන් දැකීමට සුදුසු බව.

IV.

- තෙරුවන් කෙරෙහි පැහැදීම .
- බුදු සමයේ දියුණුවට කටයුතු කිරීම .
- අවවාදානුශාසනා පිළිගැනීම .
- නිරහංකාර බව .

V. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍ර තොරතුරු ඇසුරෙන්. ලෝක විනාශයක් සිදුව නැවත ලෝකය හේතුඵලවාදී ව හටගැනීමෙන් පසු ආභස්සර බඹලොවින් චුතව ආ සත්වයෝ පිළිබඳව . රස පොළොව අනුභවය. සත්ව පරිසරය ක්‍රමයෙන් ඇතිවීම. මෛථුන සේවනයේ යෙදීම. ආරක්ෂාවට ගෙවල් සෑදීම ආදී විස්තරයක්.

3)

I. කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු - සාධු සබ්බත්ථ සංවරෝ
සබ්බත්ථ සංවුතෝ භික්ඛු - සබ්බදුක්ඛා පමුච්චති

II. කයෙන් වචනයෙන් මනසින් සංවර වීම යහපත්ය. හැමතැනම සංවර වීම යහපත්ය. හැමතැනම සංවර වූ භික්ෂුව සියලු දුකෙන් මිදෙයි.

III. අත්ථි සුඛය - දැහැමිව උපයාගත් සම්පත් ඇතැයි සිතා සතුටු වීම
භෝග සුඛය - ධාර්මිකව උපයාගත් ධනය පරිභෝජනය හා අන් අයගේ සුඛසිද්ධියට යෙදවීමෙන් ලබන සතුට.
අණන සුඛය - තමා කිසිවකුටත් ණය නැත යන සිතුවිල්ල නිසා ඇති වන සතුට. අනවජ්ජ සුඛය - නිවැරදි හා ධාර්මික ජීවිතයක් ගත කිරීම නිසා ඇතිවන සතුට.

IV. ගුරුවරයා විසින් , මැනවින් හික්මවීම/ මැනවින් ඉගැන්වීම /සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම /තම මිත්‍රයන්ට ශිෂ්‍ය හඳුන්වාදීම /ශිෂ්‍යයා ආරක්ෂා කිරීම.
ශිෂ්‍යයා විසින්, දැක හුනස්නෙන් නැගිටීම/ උපස්ථාන කිරීම/ අවවාදානුශාසනා පිළිගැනීම/ අවශ්‍ය කටයුතු ඉටු කර දී/ම මැනවින් ඉගෙන ගැනීම.

V. දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ශාන්තිය අවිරෝධය
මෙම ධර්මයන් යහපත් ව රටේ සියලු සත්වයන්ගේ සහ පරිසරය ආරක්ෂාවට යොදා ගනිමින් කටයුතු කරන ආකාරය පැහැදිලි කර තිබිය යුතුය. (කරුණු හයක්වත් ඇසුරෙන් පිළිතුර සකස් විය යුතුය.)

**II කොටස**

4)

I. පංචසීලය, අටසිල්, සිව් බඹ විහරණ, සතර සංග්‍රහ වස්තු, තෙරුවන් පිළිබඳ පිළිගැනීම. කරුණු 5ක් වත් මුල් කරගෙන පිළිතුරු සකස් විය යුතුය.

II. අපුත්තක සූත්‍රය - ධනය ගොඩ ගසා ගත යුත්තක් නොව සංසරණය කළ යුතු බව . අණන සූත්‍රය- භෝග සුඛය - උපයන ධනයෙන් තමා පිනවීම ,දෙමාපියන් පිනවීම ,අඹුදරුවන් පෝෂණය කිරීම, හිත මිතුරන්, දැසිදස් කම්කරුවන් පිනවීම. පත්තකම්ම සූත්‍රය - පංච බලි සංකල්පය. සිඟාලෝවාද සූත්‍රය - ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය ... (ධන පරිභෝජනය ට ලකුණු පහක්ද සමාජ සහජීවනයට ලකුණු පහක් ද සමස්තයක් සේ බලා ලකුණු දෙන්න)

5)

I. සංගායනා පැවැත්වීමට හේතු වූ සමාජ පසුබිම.
ඒ ඒ සංගායනාවල තොර තනතුරු භාර දීම.
සංගායනා වල ප්‍රතිඵල
චිරස්ථිතිය සඳහා යෙදවූ වැඩපිළිවෙළ.
(සමස්තයක් සේ බලා ලකුණු දෙන්න. කරුණු හතරක් වත් තිබිය යුතුයි)

II.

- ක්‍රිස්තු වර්ෂ 415 - 455 අතර රජකළ කුමාරගුප්ත රජු නාලන්දාව ආරම්භ කිරීම.
- බුද්ධ ගුප්ත තථාගත ගුප්ත බලාදිත්‍ය වැනි ගුප්ත රජවරු නාලන්දාවේ දියුණුවට කටයුතු කළ බව.
- සිසුන් දස දහසක් පමණ ඉගෙන ගත් බව.
- පශ්චාත් උපාධිය දක්වා ඉගෙනීමට අවස්ථාව ලැබීම .
- ආචාර්ය මහාචාර්යවරු 1500ක් පමණ සිටි බව.
- නාලන්දාවේ මූලික විෂය ධාරා පහක් තිබූ බව.
  - ✓ භාෂා අධ්‍යාපන විෂය ධාරාව.
  - ✓ දර්ශන අධ්‍යයන විෂය ධාරාව.
  - ✓ බුද්ධ ධර්මය විෂය ධාරාව.
  - ✓ ලෞකික අධ්‍යයන විෂය ධාරාව.
  - ✓ ලලිත කලා අධ්‍යයන විෂය ධාරාව.
- විවිධ ඉගෙනුම් ක්‍රම - දේශන විවාද සාකච්ඡා ක්‍රම
- පුස්තකාල ගොඩනැගිලි තුනක් තිබූ බව රත්නෝදය, රත්න සාගර, රත්න රංජන.( සමස්තය බලා ලකුණු දෙන්න)

6)

I. මෙම යුගයේ ඇදහිලි හා විශ්වාස රාශියක් තිබූ බව වංශ කතා, ජනකතා පුරාවස්තු ආදියෙන් හෙළි වේ.

- වෘක්ෂ වන්දනාව, නාග වන්දනාව, දේව වන්දනාව, යක්ෂ ඇදහීම, මළවුන් ඇදහීම, ග්‍රහවස්තු ඇදහීම,
- යකුන්ට අධිපතිව සිටි වෛශ්‍රවණ දෙවියාට අනුරාධපුර නගරයේ බස්නාහිර දොරටුව අසල නුගගසක් වෙන් කර තිබූ බව.

- නුග සහ තල් ගස පූජනීය වස්තු ලෙස සලකා වෛශ්‍රවණ ට නුග ගසද ව්‍යාධ දෙවියාට තල ගස ද වෙන්කර පුද පූජා පැවැත්වූ බව.
- චූලෝදර මහෝදර කතා ප්‍රවෘත්ති.
- කැලණියේ නාග වන්දනය තිබූ බව.
- පණ්ඩුකාභය රජු කාලවේල චිත්තරාජ හා වලවාමුඛී යක්ෂයන්ට දේවාල තනා දුන් බව.
- මෙම ඇදහිලි ලෞකික ජීවිතය සුභසිද්ධිය සඳහා හේතු වන බව විශ්වාස කිරීම.
- සමහර ඇදහිලි හා විශ්වාස බුදු සමය සමඟ නව අරුතක් ගත් අතර සමහර ඒවා සම්පූර්ණයෙන්ම අභාවයට පත් වූ බව.
- විමානවත්ථු, පේතවත්ථු ,දේවදූත, බාලපණ්ඩිත. දේශනා නිසා ඇදහිලි හා විශ්වාස නව අරුතක් ගත් බව.

( සමස්තය බලා ලකුණු දෙන්න)

II. අනුරාධපුර පොළොන්නරු යුගවල සඳකඩපහණ පිළිබඳ කෙටි විස්තරයක් දැක්වීම ප්‍රමාණවත්ය.

- සෙනරත් පරණවිතාන මහතා - භව චක්‍රය අර්ථ ගැන්වෙන බව.
- එච් සී පී බෙල් මහතා - එක දිශාවකට ගමන් කරන සතුන්ගෙන් සතර දිසාව සංකේතවත් වන බව.
- ඩී.ටී. දේවේන්ද්‍ර මහතා - ගොඩනැගිලි දොරටුව සැරසීමට යොදා ගත් බව.
- විලියම් ඊ වෝඩ් මහතා - සුද්ධ ස්ථානයකට ඇතුළුවීමේදී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරන බව.
  (හඳුන්වා දීමට ලකුණු පහක් ද විවිධ මත වලට ලකුණු පහක්ද සමස්තය බලා ලකුණු දෙන්න)

7)

I. ආනන්ද තෙරුන්, සැරියුත් තෙරුන්, මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය, ඛේමා තෙරණිය.

- ආනන්ද තෙරුන් - බහුශෘත භික්ෂූන් අතර අග්‍ර , ස්මෘති සම්පන්න භික්ෂූන් අතර අග්‍ර
- සැරියුත් තෙරුන් - ප්‍රඥා ඇති ශ්‍රාවකයන් අතර අග්‍ර.
- මුගලන් තෙරුන් - ඍද්ධිමතුන් අතර අග්‍ර.
- මහා ප්‍රජාපති තෙරණිය - සසුනෙහි බොහෝ කල් ඇති ශ්‍රාවිකාවන් අතර අග්‍ර.
- ඛේමා තෙරණිය - ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග්‍ර.
- උප්පලවන්නා තෙරණිය - ඍද්ධිමත් ශ්‍රාවිකාවන් අතර අග්‍ර .
  භික්ෂු-භික්ෂුණී දෙපාර්ශ්වයම ඇතුළත්ව පිළිතුරු ලිවිය යුතුය.

II. .

- දන්ත ධාතුන් වහන්සේ පිළිගනු ලැබුවේ කිත්සිරිමෙවන් රජ දවස අභයගිරි භික්ෂූන් විසින් බව.
- ධාතු වන්දනය වඩාත් ප්‍රචලිත කිරීම
- දළදා පෙරහැර ආරම්භ කිරීම
- මෙරට බෝධිසත්ව වන්දනය ආරම්භ කිරීම

- පිරිත් දේශනය නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීම
- බෞද්ධ ග්‍රන්ථ පූජනීයත්වයෙන් සැලකීම
- බුද්ධ පූජාව පිළිගැනීම
- ප්‍රතිමා වලට ගරු කිරීම
- රජවරු බෝධිසත්වරු ලෙස සැලකීම
  (කරුණු 5 කින්වත් පිළිතුර ලිවිය යුතුය)

8)

I. ජපානයට

II. බෞද්ධ ආභාසය ලැබූ ජනකවි , ජනගීත කීපයක් යොදා ගනිමින් ලියන ලද පිළිතුරක් අපේක්ෂා කෙරේ.
උදා:-
- බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට.....
- පවු කල ගොනෝ ඇදපන් ....
- බුදුන් වදින ලෙස වැඳපන් අම්මාට ..
- නිවන් පුරේ පලයන් තලගොයි පැටියා ...
- සාධුකාර දී ඔරුවක නැගී වරෙන් ....
  (සමස්තය බලා ලකුණු දෙන්න)

***